unicef | for every child

PRESS RELEASE

# දරුවන් පූර්ණ හැකියාව සාක්ෂාත් කර ගන්නා බව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාවේ දෙමාපියන්ට තවත් සහාය අවශ්‍ය බව UNICEF පවසයි

*UNICEF සංවිධානය, ලෝක දෙමාපිය දිනය සමරමින්, දරුවන්ගේ මොළයේ වර්ධනයට සහාය වීම සඳහා දෙමාපියන්ට අවශ්‍ය කරන මාර්ගෝපදේශ සම්පාදනය කිරීම සඳහා BetterParenting.lk වෙබ් අඩවිය සහ ගායක රොමේෂ් සුගතපාල, ගුවන් විදුලි නිවේදක ෂැක් සහ නිළියක වන සචිනි අයේන්ද්‍රා පෙනී සිටින " සුපිරි බලය" නැමති වඩාත් හොඳ දෙමාපියෙකු ලෙස කටයුතු කිරීමට මග පෙන්වන ප්‍රචාරණ ව්‍යාපාරයක් දියත් කරයි.*

**2019 ජූනි 3 දින, ශ්‍රී ලංකාව, කොළඹ:** ලෝකය දෙමාපියන් විසින් ඉටු කරනු ලබන ජීවිත වෙනස් කරන කාර්ය භාරය අගයමින් ලෝක දෙමාපිය දිනය (ජූනි 1) සහ පියවරුන්ගේ දිනය (ජූනි 16) සමරද්දී UNICEF සංවිධානය අද දරුවන්ගේ මෙන් ම අනාගත පරම්පරාවන්ගේ ද සමස්ත ජීවිතය පුරා මොළයේ වර්ධනයට බලපෑ හැකි මුල් ළමා වියේ රැක බලා ගැනීමේ, සමාජගත කිරීමේ හා විනයගත කිරීමේ භාවිතයන් මගින් ළමයෙකුගේ පළමු අවුරුදු 5 තුළ දී දෙමාපියන් ඉටු කරන තීරණාත්මක කාර්ය භාරය කෙරෙහි අවධානය යොමු කරයි.

දරුවන්ට 'ආහාර ගැනීම, කෙළි සෙල්ලම සහ ආදරය ලැබීම' ලෙස සාමාන්‍යයෙන් හැඳින්වෙන මනා පෝෂණය, උත්තේජනය හා රැකවරණය ලැබෙන බව සහතික කිරීමේ දී දෙමාපියන් ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරන නමුත් දරුවන් පූර්ණ හැකියාව සාක්ෂාත් කර ගන්නා බව සහතික කිරීම සඳහා ඔවුන්ට තව දුරටත් සහාය අවශ්‍ය වේ. **මනා පෝෂණයක්** ලබා දීමෙන් මොළයේ වර්ධනය වේගවත් වන අතර පළමු අවුරුදු 5 තුළ දී ප්‍රමාණවත් පෝෂණයක් ලබා දීම පසු කාලයේ දී ආපසු හැරවිය නොහැකි ආකාරවලින් මොළයේ ව්‍යුහයට හා ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපායි. එසේ වුව ද ආහාරවල විවිධත්වය හා ආහාර වේල්වල නිරන්තරතාව සම්බන්ධයෙන් ගත් විට* මාස 6-23 අතර වයසේ පසු වන ශ්‍රී ලංකාවේ දරුවන්ගෙන් 38%කට අවම පිළිගත හැකි ආහාර වේලක් නොලැබේ. වයස අවුරුදු 5ට අඩු දරුවන්ගෙන් 17%ක් 'කුරු' බවින් ද, 15.1%ක් 'දුර්වලකමින්' ද පෙළෙති. මේ සියල්ල ම දුර්වල පෝෂණයේ ප්‍රතිඵල ය. 2006 සහ 2016 වර්ෂ අතරතුර දී කිසිදු සැලකිය යුතු වැඩි දියුණුවක් සිදු වී නැත.* ළාබාල දරුවන් සහ දෙමාපියන් අතර සිදු වන අන්තර් ක්‍රියාව මගින් කෙළි සෙල්ලම **හා උත්තේජනය** සඳහා අවස්ථා සම්පාදනය කිරීමෙන් දරුවාගේ ඉගෙනුම් හැකියාව ධනාත්මක ලෙස හා ස්ථිරසාර ලෙස ශක්තිමත්කළ හැකි ය. එහෙත් ශ්‍රී ලංකාවේ දරුවන්ගෙන් 19.4%ක් තම නිවසේ ළමා පොත් නොමැති බව* වාර්තා කර ඇති අතර ඉන් අදහස් වන්නේ මුල් කාලීන උත්තේජනය ලබා දිය හැකි වඩාත් ම වැදගත් ආකාරවලින් එකක් අහිමි වීමේ අවදානමට ඔවුන් ලක්ව සිටින බව යි. දරුවන්ට **ආදරය හා අපයෝජනයෙන් ආරක්ෂාව** තහවුරු කිරීම මගින් මොළයේ වර්ධන ක්‍රියාවලිය බිඳ දමන සහ සෞඛ්‍යයට, ඉගෙනීමට හා චර්යාවට හානි කරන "විසකුරු ආතතිය" සීමා කිරීමට දෙමාපියන්ට හැකියාව ලැබේ. කෙසේ වුව ද වයස අවුරුදු 1-14 අතර දරුවන්ගෙන් 73.4%ක් නිවසේ දී දෙමාපියන් විසින් පමුණුවනු ලබන ශාරීරික දඬුවම් අත්දැක ඇත.**

තම දරුවන්ට හොඳ ම ආරම්භය ලබා දීම සඳහා දෙමාපියන්ට සහාය වීම පිණිස UNICEF සංවිධානය අද දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් www.BetterParenting.lk වෙබ් අඩවිය දියත් කර ඇති අතර එම අඩවිය ළමා රැකවරණය, ළමා සංවර්ධනය, ආහාර හා පෝෂණය සහ සෞඛ්‍යය යන ක්ෂේත්‍ර හතර සම්බන්ධ ලිපි, වීඩියෝ හා සජීවිකරණ මාලාවක් මගින් විශේෂඥ තොරතුරු රැසක් එක්තැන් කරයි.

BetterParenting.lk අඩවිය දියත් කිරීම සඳහා සහාය දෙමින් UNICEF සංවිධානය "දෙමාපිය සුපිරි බලය" නමින් ප්‍රචාරණ ව්‍යාපාරයක් ද දියත් කර ඇත. සුප්‍රකට ගායකයෙකු හා සංගීතඥයෙකු වන **රොමේෂ් සුගතපාල**, සුප්‍රකට ගුවන් විදුලිනිවේදකයෙකු වන ෂැක් **(රියාස් ෂා ජහාන්)** සහ නිළියක සහ 2003 වසරේ මිස් ශ්‍රී ලංකා කිරුළ දිනූ **සචිනි අයේන්ද්‍රා** ඊට සහභාගි වන අතර ඔවුහු ද ළාබාල දරුවන් සිටින දෙමාපියෝ වෙති. **ඉලංගෝ රාම්** අධ්‍යක්ෂණය කළ තත්පර 60 චිත්‍රපට තුනක් තම දරුවාගේ වර්ධනයට සහාය වීම සඳහා අවශ්‍ය කරන 'සුපිරි බලය' සෑම දෙමාපියෙකු ම සතුව තිබෙන සැටි අවධාරණය කරයි.

"ළාබාල දරුවෙකුගේ ජීවිතයේ වඩාත් ම වැදගත් පුද්ගලයන් වන්නේ දෙමාපියන් හා රැක බලා ගන්නන්" යැයි UNICEF ශ්‍රී ලංකා සංවිධානයේ නියෝජිත ටිම් සටන් පැවසී ය. "ළාබාල දරුවෙකුගේ වර්ධනය මනා සෞඛ්‍යය හා පෝෂණය, ආදරය හා රැකවරණය, සුරක්ෂිතතාව හා ආරක්ෂාව සහ ගුණාත්මක මුල් කාලීන ඉගෙනුම මත රඳා පවතිනවා. සෑම දෙමාපියෙකු ම තම දරුවාගේ උපරිම යහපත උදෙසා කටයුතු කළ යුතු යි. දරුවන්ගේ ජීවිතයේ මුල් අවුරුදුවල දී කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් දෙමාපියන්ට සහාය වීම මගින් පූර්ණ වර්ධනය අත් කර ගැනීමට, තමන්ගේ, තම ප්‍රජාවන්ගේ හා තම රටේ වැඩි දියුණුව සාක්ෂාත් කර ගැනීමට සියලූ දරුවන්ට පවත්නා අයිතිය සහතික කළ හැකි යි."

දරුවන්ට පෝෂණ රැකවරණය සුරක්ෂිත කිරීමට නම් ඒ සඳහා සහායක වන ප්‍රතිපත්ති, වැඩසටහන් හා සේවාවන් පවුල්වලට අවශ්‍ය වේ. පසු ගිය මාස 12 තුළ දී ශ්‍රී ලංකාවේ රජය පෝෂණ රැකවරණයට සහාය දීම පිණිස *ජාතික මුල් ළමා විය රැකවරණ හා සංවර්ධන ප්‍රතිපත්තිය* සහ *ජාතික විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය* ඇතුළු වැදගත් ප්‍රතිපත්ති කිහිපයක් අනුමත කර හෝ ක්‍රියාත්මක කර ඇති අතර මුල් ළමා විය සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා පළාත් සභාවලට 2019 ජාතික අයවැයෙන් අමතර අරමුදල් සම්පාදනය කර, ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ජාතික රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව වැඩසටහන දියත් කර ද ඇත.

"දෙමාපිය සුපිරි බලය" ව්‍යාපාරය නිර්මාණය කරන ලද්දේ ලියෝ බර්නට් සමූහයට අනුබද්ධ ආයතනයක් වන Publicis Sri Lanka සහාය ඇතිව ය.

දත්ත විමර්ශන

** Demographic Health Survey 2016, Department of Census and Statistics, Sri Lanka*

*** Know Violence in Childhood, 2017. Ending Violence in Childhood: Global Report 2017, New Delhi, India*

###අවසානය###

**UNICEF පිළිබඳව වැඩි දුර තොරතුරු දැන ගැනීම සඳහා කරුණාකර අමතන්න:**

**ජෙරමි ස්ප්‍රිජ්, සන්නිවේදන විශේෂඥ, UNICEF ශ්‍රී ලංකා,**

**දුරː +94 77 723 6548, jsprigge@unicef.org**

**සුසාන් වූස්ටර්-ප්‍රේමතිලක, සන්නිවේදන නිලධාරි, UNICEF ශ්‍රී ලංකා**

**දුරː +94 77 316 5378, swooster@unicef.org**

**සංස්කාරකවරයාට සටහනක්**

**UNICEF ශ්‍රී ලංකා ගැන**

UNICEF සංවිධානය එය කරන සෑම කටයුත්තක දී ම සෑම දරුවෙකුගේ ම අයිතිවාසිකම් හා යහපැවැත්ම ප්‍රවර්ධනය කරයි. අපගේ හවුල්කරුවන් සමග එක්ව රටවල් හා භූමි ප්‍රදේශ 190ක දී සෑම තැනක ම සියලූ දරුවන්ට ප්‍රතිලාභ අත්

කර දීම සඳහා එම කැප වීම ප්‍රායෝගික ක්‍රියාව බවට පරිවර්තනය කිරීමට කටයුතු කරන අතර වඩාත් ම ගොදුරු වීමට ඉඩ ඇති දරුවන් සහ බැහැර කරන ලද දරුවන් වෙත ළගා වීම සඳහා විශේෂ පරිශ්‍රමයක් දරයි. UNICEF ශ්‍රී ලංකා පිළිබඳව වැඩි දුර තොරතුරු දැන ගැනීම සඳහා www.unicef.lk වෙබ් අඩවියට පිවිසෙන්න.